# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

# පිරිවෙන් සාමාන්‍ය පෙළ විභාගය
# 2023 (2024)

2024 අප්‍රේල් මාසයේදී පැවැත්වීමට නියමිත "පිරිවෙන් සාමාන්‍ය පෙළ විභාගය - 2023 (2024)" සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. උක්ත විභාගය සඳහා අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලියාපදිංචි මූලික පිරිවෙන්, මහ පිරිවෙන්, බෞද්ධ සීලමාතා අධ්‍යාපන ආයතන හා විශේෂ පිරිවෙන්වලින් පමණක් බැවින් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලියාපදිංචි ඉහත කී පිරිවෙන්වලට අයදුම්පත් මේ වන විට තැපැල් මගින් යවා ඇත.

02. 2024 පෙබරවාරි මස 12 දින වන විටත් අයදුම්පත් නොලද අධ්‍යාපන අමාත්‍යාංශයේ ලියාපදිංචි මූලික පිරිවෙන්, මහ පිරිවෙන්, බෞද්ධ සීලමාතා අධ්‍යාපන ආයතන හා විශේෂ පිරිවෙන් වේ නම්, තම ආයතනයෙන් ඉදිරිපත් කරන අයදුම්කරුවන් සංඛ්‍යාව සඳහන් කර විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් අයදුම්පත් ඉල්ලුම් කළ යුතුය.

03. මෙම විභාගයට ඉදිරිපත් වන පෞද්ගලික අයදුම්කරුවන්ට අවශ්‍ය අයදුම්පත් සතියේ දිනවල කාර්යාල වේලාවන් තුළදී විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාව වෙත පැමිණ ලබා ගත හැකි අතර, තැපෑලෙන් ලබා ගැනීම සඳහා තම තම හා ලිපිනය ලියූ රු. 130.00 ක වටිනාකමකින් යුත් මුද්දර ඇලවූ 10×7 ප්‍රමාණයේ ලියුම් කවරයක් සමග 2024 පෙබරවාරි මස 12 දිනට පෙර පහත සඳහන් ලිපිනයෙන් ඉල්ලුම් කළ යුතුය. එම ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ "පිරිවෙන් සාමාන්‍ය පෙළ විභාගය - 2023 (2024 )" යනුවෙන් සඳහන් කළ යුතුය. අයදුම්පත් දෙපාර්තමේන්තු වෙබ් අඩවියෙන් **(www.doenets.lk)** බාගත කිරීමට ද පහසුකම් සලසා ඇත.

04. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2024 පෙබරවාරි මස 20 දින වේ. සම්පූර්ණ කරන ලද අයදුම්පත් එදිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් "විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග සංවිධාන ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1503, කොළඹ." යන ලිපිනයට යොමු කළ යුතු අතර, අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "පිරිවෙන් සාමාන්‍ය පෙළ විභාගය - 2023 (2024)" යනුවෙන් සඳහන් කළ යුතුය.

05. අසම්පූර්ණ හා ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**එච්. ජේ. එම්.සී. අමිත් ජයසුන්දර**
**විභාග කොමසාරිස් ජනරාල්**

**5/5/4/3/2023**
**ආයතනික විභාග සංවිධාන ශාඛාව,**
**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,**
**පැලවත්ත, බත්තරමුල්ල,**
**2024 පෙබරවාරි මස 08 වන දින.**

tamilguru.lk